ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 ඔක්තෝබර් 07 සඳුදා
05 වෙළුම - 48 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## බැති සිතින් දරුවන් හා දෙමව්පියන් රොක්වන
# මාරවිල කුරුස පල්ලිය

Photo By: Thilina Alahakoon

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# ඒබ්‍රහම් ලින්කන් සිය, දයාබර පුත්‍රයාගේ මුල් ගුරුතුමාට යවන ලද ලෝක ප්‍රකට ලිපිය.

## ආදරණීය දුවේ පුතේ...

**උපුටා ගැනීම :-** LINCON THE UNKNOWN BY DALE CARNEGIE

**පරිවර්තනය :- නොහඳුනන ලින්කන් - ගාමිණී කුමාර විතාන**

අද කතුවැකියට මම උපුටා ගැනීමක් කරන්නේ Dale Carnegie ලියූ Lincon the Unknown පොතෙහි පරිවර්තනය කළ ගාමිණී කුමාර විතානගෙ නොහඳුනන ලින්කන්නම් කෘතියෙහි මේ ඔවදන හරිම වටිනවා. දහම් සිතිවිල්ලෙන් මෙය කියවා බලන්න.

''මුල් ගුරුතුමෙනි, මගේ පුතාට කියා දෙන්න හැම මනුෂ්‍යයකු ම සත්‍යවාදී සහ සර්ව සාධාරණ නොවන බව. නමුත් ඔහුට කියා දෙන්න හැම තක්කඩියකු, දුර්ජනයකු පාසා ම ගුණයහපත් වීරවරයෙකුත් මේ ලෝකයේ සිටින බව. ඒ කියන්නේ හැම දෙනා ම තක්කඩින් නොවේ. තක්කඩි වාගේ ම, යහපත් උදවියත් සිටිනා බව මගේ පුතාට උගන්වන්න. සෑම ආත්මාර්ථකාමී දේශපාලනඥයකු වෙනුවට රටේ සුබසිද්ධියට කැප වුනු යහපත් දේශපාලනඥයකුත් ඉන්නා බව මගේ පුතාට ඒත්තු ගන්වන්න. සෑම සතුරකු පාසාම මිතුරෙකුත් සිටිනා බව මගේ පුතාට කියා දෙන්න. ඒ වගේ ම කියා දෙන්න නොමිලයේ කාගෙන් හරි කොහෙන් හරි ලැබෙන ඩොලර් පහට වඩා තමාගේ දහඩිය මහන්සියෙන් උපයන ඩොලරය වටිනාකමින් වැඩි බව. ඒ බව ඔහුට ඒත්තු ගැන්වීමට කලක් ගතවන්නට පුළුවන් බව මා දන්නවා. නමුත් ඒ සත්‍යය ඔහුට උගන්වන්න. පරාජය විඳ දරාගැනීමටත් , ජයග්‍රහණය නිහතමානී ව සතුටින් බුක්ති විඳීමටත් මගේ පුතාට උගන්වන්න. ඇතැම් උදවිය ඊර්ෂ්‍යාකාරී ව ඔහු යටපත් කරන්නට ඈත් කරන්නට ක්‍රියා කරන විට ඒවා ගැන කලකිරීමෙන් තොර ව සන්සුන් ව සිටිමින්, සිත යටින් සිනාසෙන්නට හැකි ශක්තිය, රහස ගැන ඔහුට උගන්වන්න. තමන්ගේ හයිහත්තිය පෙන්වා මිනිසුන් බියගන්වන්නට එන අය මේ ලොව පරාජය කිරීමට පහසු ම අය බව ඔහුට අවබෝධ කරවන්න.

මුල් ගුරුතුමනි, ඔබට හැකි නම් ඔහුට පොතේපතේ ඇති චමත්කාරය පෙන්වා දෙන්න. එපමණක් නොව අහසේ සැරිසරන කුරුල්ලන්, හිරු රැසේ පියාඹන මීමැස්සන්, නිල්වන් කඳු බෑවුමක පිපී වැනෙන වන මල්, කියාපාන සදාතනික රහස ගැන ඔහුට නිවීසැනසිල්ලේ සිතන්නටත් ඉඩ හරින්න. වංචා කිරීම , හොරමැරකම් කිරීමට වඩා පරාජයට මුහුණ දීම ගෞරවාන්විත බවත්, අනෙකුත් අය කුමක් කීවත් තමන් ගේ අවංක අදහස් ගැන විශ්වාසය තබා ක්‍රියා කිරීම ඉතා වටිනා බවත් මුල් ගුරුතුමනි, ඔහුට වටහා දෙන්න. ඒ වාගේ ම මුල් ගුරුතුමනි, මගේ පුතා පුරුදු පුහුණු කරන මෘදු මොළොක් මිනිසුන්ට මෘදු ලෙස සලකන්නටත්, රළු මිනිසුන්ට රළු ලෙස සලකන්නටත්, තමන් වටේ සිටින උදවිය කරන දෙය අන්ධානුකරණයෙන් පිළි නොගෙන තමාගේ ම බුද්ධිය මෙහෙයවා යුතුකම අයුතුකම තේරුම් ගෙන ක්‍රියා කිරීමේ ශක්තිය ඔහුට ලබා දෙන්න. සෑම කෙනෙකුට ම සවන් දීමට ඔහුට උගන්වන්න. එහෙත් ඔහු අසන දෙය සත්‍යය අනුව කිරා මැන බලා හොඳදේ පමණක් ගන්නට ඔහුට හැකියාව ලබා දෙන්න. කඳුලු සැලීම ලැජ්ජාවට කරුණක් නොවන බවත් ඔහුට කියා දෙන්න. හැම දෙයක ම වැරදි සොයන්නන් ගණන් නොගැනීමටත්, මිහිරි චාටු බස් දොඩවන්නන් ගැන පරිස්සම් වන්නටත් ඔහුට කියා දෙන්න. තමන්ගේ හිතේ ශක්තිය වැඩි ම මිලට ඉල්ලන්නන්ට විකුණුවත්, තමන්ගේ හදවත සඳහා කිසි විටෙකත් මිලක් නො ඉල්ලන්නට ඔහුට උගන්වන්න. බොරු ඝෝෂාවන් කරන සෙනඟ මධ්‍යයේ කන් පියාගෙන ඉන්න ඔහුට ධෛර්යය දෙන්න. නමුත් සත්‍යය යයි පිළිගන්නා දේ වෙනුවෙන් ධෛර්යවත් ව සටන් කරන්නට ඔහුට උගන්වන්න.

මුල් ගුරුතුමෙනි, ඔහුට මෘදු ලෙස සලකන්න. නමුත් ඔහු හුරතල් කරන්නට එපා. වානේ හොඳින් තැනිය හැක්කේ ගින්නෙන් රත් වූ විට බව ඔහුට පැහැදිලි කරන්න. ඒ නිසා ජීවිත ගමනේ දී තමාට හැඩි දැඩි රශ්මියක් දැනුණොත් එයින් තේරුම් ගන්නට සලස්වන්න. ඔහු කාට වත් යටත් කරන්න බැරි මිනිසකු හැටියට දියුණු වීමට ඒ අත්දැකීම ප්‍රයෝජනවත් වන බව. ධෛර්යවත් ව දරාගත යුතු නිර්භීතකමට අවශ්‍ය ඉවසීම ඔහුට තිබිය යුතුය. හැම විටම තමා ගැන උදාර උසස් විශ්වාසයක් ඇති කරගන්නට ඔහුට උගන්වන්න. මුළු මහත් මිනිස් වර්ගයා ගැන ම එබඳු විශ්වාසයක් ඇති කරගන්නට පුළුවන් වන්නේ එහෙම කළොත් පමණයි. එහෙත් ඔහුට මේ කියන අධ්‍යාපනය ලබා දීම බැරෑරුම් කාර්යයක් බව මා දන්නවා. ඒ නිසා මුල් ගුරුතුමනි, ඔබට හැකි හැම දෙයක් ම මගේ දරුවා වෙනුවෙන් මේ ආකාරයට කරන්න. එපමණයි, මගේ දරුවා ඒ අයුරු පන්නරය ලබන බව මට විශ්වාසයි.

මුල් ගුරුතුමාට ලිව්වත්, ආදර දුවේ පුතේ ඔබේ ආධ්‍යාත්මයටත් මේ කියමන් තදින්ම දැනෙනවා නේද? හොඳට හිතන්න.

**ඔබට ජේසු පිහිටයි**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




## ඒදිනෙදා ජීවිතයට

★ **දේව ප්‍රසාද නිධාන**

1. ප්‍රසාද ස්නාපනය
2. සමගි සන්ධානය (පාපොච්චාරණය)
3. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
4. අභිවෘද්ධි ආලේපය
5. පූජකවරය
6. ආශිර්වාදකාර බන්ධනය
7. රෝගීන් ආලේප කිරීම

★ **ණය මංගල්‍ය දිනයන් (ශ්‍රී ලංකාවේ)**

1. සෑම ඉරුදිනක්ම
2. නත්තල් මංගල්‍යය (දෙසැම්බර් 25)
3. දෙව් මව් පිළිසිඳීමේ මංගල්‍යය (දෙසැම්බර් 08)
4. දෙව් මව් ස්වර්ගාරෝපණය වීමේ මංගල්‍යය (අගෝස්තු 15)
5. දෙව් මව්ගේ මාතෘත්වයේ මංගල්‍යය (ජනවාරි 01)
6. රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය (ජන. 02 දා සිට 8 දා අතර ඉරුදින)
7. අහස් නැගීමේ මංගල්‍යය (උත්ථානයට පසු 7 වන ඉරුදින)
8. දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය (ඉරුදින පවත්වන නිසා) (ශු. ත්‍රිත්වයේ මංගල්‍යයට පසු ඉරුදින)

★ **එක්වරු නියමිත දිනයන්**

1. අළු බදාදා
2. මහ සිකුරාදා

★ **ගොඩමස් වැළකීමේ නියමිත දිනයන්**

1. අළු බදාදා
2. මහ සිකුරාදා
3. සෑම සිකුරාදා දිනයක්ම

## භාවනාව හා ගැඹුරු දේව සබඳතාව

ඒ සඳහා ඔබ කළ යුත්තේ ඔබගේ පුද්ගලික ජීවිතය ගැන මෙනෙහි කිරීමයි. ඔබව වේදනාවට හෝ කලකිරීමට හෝ ඔබට තරහාව ඇති වන අතීත සිදුවීම් හා පුද්ගලයන් සිහිකර ඔවුනට සමාව දීමයි. ජේසු සමිඳුන් ''මනස්ථාපනය වන්න'' කියා පවසන්නේ මේ ඇතුලාන්ත පවිත්‍රවීමටයි.

මනස්ථාපනය වන පුද්ගලයා තුළ දෙවි පියාණන් වහන්සේ හා ගැඹුරින් සම්බන්ධවන්නට තමා තුළ බලවත් ආශාවක් ඇතිවේ. එම ආශාව ඉටු කර ගැනීමට බොහෝ දේ අත්හැරිය යුතුයි. නරක ආශ්‍රය , නරක ක්‍රියා, අහිතකර ගති ගුණ නපුරු වචන, සිත තුළ බද්ධ වෛරය, ක්‍රෝධය , පළිගැනීම හා වරදට යොමු කරන ස්ථාන ආදිය අත්හැරිය යුතුයි. අසීසියේ ශු. ප්‍රැන්සිස් මුනිතුමා කදිම නිදසුනකි. ඔහු ඉතා ධනවත් පවුලකට දාව උපත ලැබීය. ජේසු සමිඳුන්ව අනු ගමනය කරන්නට ඔහු ගත කළ සෙල්ලක්කාර ජීවිතය, සියළුම සැප සම්පත් හා ධනය අතහැර සිඟන්නකු බවට පත් විය. එතුමාට එසේ කිරීමට හැකි වුයේ නිහඬ යාච්ඤාව තුළින් ඇතුලාන්තයේ වැඩ වසන දෙවිඳුන් හා ගැඹුරින් සම්බන්ධ වූ බැවිනි.

**සමාධිගතවීම**

මෙලෙස ශාරීරික හා මානසික බැඳීම්වලින් නිදහස් වූ විට ජීවිතයේ කිසි දෙයකින් අත් විඳිය නොහැකි ඇතුලාන්ත නිශ්චල ශාන්තවූ බවක්, ඇතුලාන්ත සාමය හා සතුට අත්දැකීමක් වේ. සිත සමාධිගතවේ ජීවිතය (යහපත් අතට) වෙනස් වන්නට පටන් ගනියි. සෑම පුද්ගලයෙක් හා සිදුවීමක් දෙසම සුභවාදිව බලන්නට යොමු වේ. ජාති, කුල , ආගම් හා පංති ආදි කිසිදු භේදයක් සිත තුළ නොපවති. සෑම පුද්ගලයෙකුම තම සොයුරු සොයුරියන් ලෙස පිළිග න්නට තරම් ගැඹුරු මනුෂ්‍යත්වයෙන් පිරී යයි. අසීසියේ ශු. ප්‍රැන්සිස් තුමා සෑම මැවිල්ලකටම ආමන්ත්‍රනය කළේ සොයුරා, සොයුරිය කියමින්ය. උදා :- සඳ සොයුරිය, හිරු සොයුරා සොයුරු වෘකයා (සතුන් පවා). එසේ ම අප නිකායේ ආරම්භක මව්තුමිය ''මගේ පවුල යන්න මුළු ලෝකයයි'' කීවාය.

**දෙවිඳුන් හමුවීම හෙවත් සබැඳියාව**

සමාධිගතවූ පුද්ගලයා තමා තුළ වැඩ වසන දෙවි පියාණන් හා සම්බන්ධ වේ. දෙවිඳුන් හා ධ්‍යාන ගතවේ. මෙම අවස්ථාවට පැමිණෙන විට බාහිර ලෝකය පිළිබඳ කිසිදු හැඟීමකට හෝ සිතුවිල්ලකට පවා අවදි නොවේ. සිතිවිලි හා හැඟීම් අභිබවා ගොස් ය. ඇතුලාන්ත නිහඬබව හා හිස්බව පමණක් අත්දකියි. මෙම අවස්ථාවට ළඟා වූවෝ ශුද්ධවන්තයින් හා ශුද්ධවන්තියන් ය.

ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය

ඉදිරියට .......

# සීයා සහ මුණුබුරා....

සීයා ඊයේ කිව්වා නේද අද විශේෂ කතාවක් කියනවායි කියලා, ඉතින් ඒ කතාව දැන් කියන්න.
ඔව් පුතා, පුතාට කියන්න තියනවා මෙතෙක් අසනන්ට නොලැබුණු විශේෂ ස්තුති කිරීමක් පිළිබඳ කතා ප්‍රවෘතියක්. ඒ මොකක්ද සීයේ?
පුතේ මම කොළඹ ශාන්ත පීතර විද්‍යාලයේ සේවය සඳහා ඇතුලත් උනේ 1953 අවුරුද්දේ. පුතා දන්නවා ඇති ශාන්ත පීතර විද්‍යාලය කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයේ ශාඛාවක් ලෙස ආරම්භ වුයේ 1922 වර්ෂයේ කියලා. 1922 සිට 1943 වර්ෂය දක්වා අවුරුදු 21 ක් විද්‍යාලාධිපති පියතුමා වශයෙන් අති විශිෂ්ට සේවයක් ඉටු කළේ ගෞරවනීය ඩී.ජේ.නිකොලස් පෙරේරා පියතුමන් විසිනි.

1956 සිට 1963 දක්වා අවුරුදු 7 ක් විදුහල්පති ලෙස පාලනය කරන ලද්දේ ගෞරවණීය ආතර් එන්. ප්‍රනාන්දු පියතුමා, එතුමා ශාන්ත පීතර විද්‍යාලයේ සේවය බාර ගැනීමට පෙර සේවය කළේ. කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයේ. ඒ කාලේ තමයි ම මේ කියන්න යන ඒ විශේෂ ස්තුති කිරීම සිදු වුයේ. එතුමා විසින් එම සිදුවීම මා හට ප්‍රකාශ කලේ එම උත්තරීතර සිදුවීම එතුමාණන්ගේ අභාවයත් සමග අහෝසි නොවන ලෙසටය කියා මම සිතනවා. ඇත්ත වශයෙන්ම පුතේ එම විශේෂ සිද්ධිය මම පුතාට කියන්නේ මෙම විශේෂ සිද්ධිය තවත් ඉදිරියට පවතිණු පිනිසයි.
පුතේ ගෞරවණීය ආතර් එන්. ප්‍රනාන්දු පියතුමාණන් ශාන්ත ජෝශප් විද්‍යාපයේ සේවය කළ අවසාන භාගයේ එක් සැන්දෑවක එම විද්‍යාලයේ ඉගෙනීම ලැබූ එවකට සමාජයේ උසස් තානාන්තරයක් දරමින් සමාජයට විශිෂ්ට සේවාවක් ඉටු කරන ආදර්ශමත් තරුණයෝ පැමිණි අතර, ගරු පියතුමාද ඔහුව ආදරයෙන් පිළිගෙන වාඩිවීමට පවසා පැමිණි කාරණය විමසූ විට එම තරුණයා කියා ඇත්තේ මෙන්න මෙහෙමයි.

ඒ මොකක්ද සීයේ.
එවිට තරුණයා කතා කරමින් ගෞරවනීය පිය තුමෙනි මම අද මෙලෙස සමාජයේ උසස් තානාන්තරයක් දරමින් සමාජයට මහඟු සේවාවක් කිරීමට අවස්ථා ලැබුනේ ඔබ තුමාණන් යටතේ අධ්‍යාපන ලබන කාලේ එක දවසක මා විසින් කරන ලද බරපතල වරදකට එදා එම අවස්ථාවේදීම ඔබ තුමාණන් මට දුන් කම්මුල් පහරයි. ඇත්ත වශයෙන්ම ගෞරවණීය පියතුමෙනි, මට එදා එම කම්මුල් පහර නොදෙන්නට මම අද සිර මැදිරියක තනිව දුක් විඳින සිරකරුවෙක්, නැතිනම් නොයෙක් කල කෝලාහාල වලට පැටලී ජීවිතයෙන් වන්දි ගෙවන්නට තිබුනා. ඉතින් ගෞරවණීය පියතුමෙනි මා විසින් පිරිනමන මෙම පුංචි ත්‍යාගය බාර ගෙන මට යන්නට අවසර දෙන්න යයි පැවසූ තරුණයා පිටව ගියාලු ඇත්ත වශයෙන්ම පුතේ මෙම කතා ප්‍රවෘත්තිය අධ්‍යාපනය ලබන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙන්ම ඔවුන්ගේ දෙමාපියන්ටත් මහඟු ආදර්ශයක් වනු ඒකාන්තය. ඔන්න ඕක තමයි පුතේ මම කියනවයි කිව්ව ඒ කතාව, මම දැන් යනවාටිකක් භාවනා කරන්න. පුතාට ජේසු පිහිටයි. සීයටත් බොහොම ස්තුතියි ජේසු පිහිටයි.

බී.සී. රුද්‍රිගු - නුගපේ
(ශාන්ත පීතර විද්‍යාලයේ හිටපු ලේඛකාධිකාරී)




# ජේසුට SMS එකක්

එක්තරා පල්ලියකට මම ගියේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වඩමවලා තියන වෙලාවක පල්ලියේ ඒ හැටි දෙනෙක් හිටියේ නැහැ.
මම පිටුපසම බංකුවේ දණ ගැහුවේ ඉස්සරහ හිටි අයට හිරිහැරයක් නොවන විදියට හිතේ තියෙන සේරම කියාගන්න බැරි උනත් පුරුදු විදියට වැඩියෙන් ඉල්ලලා අඩුවෙන් ස්තුති කරලා හරි බරි ගැහිලා බංකුවෙන් වාඩි උනේ යන්න හදිසියක් නොතිබුන නිසා.
බැගයට අත දාලා ශු. පැය පොත හෙව්වා තනියම කියන කොට ශු. පැය පැය භාගෙන් ඉවර කරන්න පුලුවන් හින්දා ඒ අතරෙ අකීකරු ඇස් හතර වටේ දිව්වේ මමත් කාන්තාවක් නිසා වෙන්න ඇති. හිරිමල් වයසේ ගැනු ළමයෙක් දෙකට තුනට නැමීගෙන ඉදිරිපස බංකුවේ හිස ගහ ගෙන යාච්ඤා කරනවා. මට හරි ආස හිතුනා ඇයි ඉතින් මේ තරම් භක්තියකින් ඔරසන් කියනවා දකින්න ලැබුණ නිසා, අනික වැඩිහිටි කාන්තාවක හෝ තරුණ කෙනෙක් නෙමෙනේ ඇය, පහන් වූ සිත් ඇතිව මටත් ශු. පැය පොතට නෙත් යොමු කළා.
විනාඩි 10 ක් 15 ක් ගත වෙන්න ඇති විඩාබර මගෙ ඇස් ඔසවන විට යළිත් මම දැක්කේ පෙර කී යුවතිය ඇය තවමත් පෙර පරිදිම හිස බංකුවේ ගසාගෙන අඬනවාද? සමහර විට දරා ගන්න බැරි ප්‍රශ්නයක් ද? මගේ විපරම් දැස ඇය වටේම සැරි සරනවා. කාලේ වෙනස් තාලෙ අලුත් නේ විදුලි වේගයෙන් ජංගම දුරකථන පුවරුව මත දුවන ඇගේ අතැගිලි මම දැක්කේ අහම්බෙන්. නිවෙන පත්තුවන එහි ආලෝකය මට කිව්වේ ඒ **SMS** සංවාදයක් බවයි. සමහර විට යාච්ඤා කරනවට වඩා ජේසුට **SMS** අරින එක පහසු ඇති කාලේ වෙනස් නේ....

**නිලූෂා ඇන්**
**(ආචාර්ය මඩුල්ල)**
**ශු. පවුලේ දහම් පාසල - රාජකදළුව**

## මාසික සිතිවිල්ල






සේයා :-
ශ්‍රියාංගණී පිලිෂියා

"ඔක්තෝබර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, , ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.




## තුති වේවා......

දයාබර මව් නුඹම නම්
උතුම් මව් නුඹම විය හිතවත්
ගරු ජසින්තා පැවිදි සොයුරියනි
මතකද එදා නුඹ පෙව්වා සිප් කිරි
මගේ දියුණුව උදෙසා.....
නිමාවන එකදු නිමේෂයක් තුළ
හමන සැම පවන් පොදක
නුමේ කුළුණුබර ඔවදන්
ගිගුම් නින්නාද වන්නේය...
ජීවිත ගමනේ රුවල් ගසා පදිමි අද මම
කප්පරක් දිග සප්ත සයුර.....

**ශානුක මධුරංග**
9 ශ්‍රේණිය
හා. ජුසේවාස් දහම් පාසල
සිමාවේලිය
(පුත්තලම මීසම)

## සදුණය ගැතියි

පොහොනි කර දුක
නේත්‍ර විල් තෙර
රුදුරු කඩු තුඩු මතින්
විදු නැණ සොයන්නට
දිරිය සවිය වුයේ ඔබයි,
අඳුරු සෙවණැලි වෙලාගත්
ලොව තුළ
අලුත් දේ සොයන්නට
අත දුන්නේ ඔබයි,
විටෙක පියෙකු ලෙස
විටෙක ගුරුවරයෙකු ලෙස
දිරි දුන්නේ ඔබයි,
ඔබගේ අමිල සේවයට
සදාණය ගැතිය අප

**නිමේෂා මධුමාලි සමරකෝන්**
13 ශ්‍රේණිය
ශා. අන්තෝනි මහා විද්‍යාලයය - අලගොල්ලෑව

## ජේසු අම්මේ කියා දෙන්න මට

ජීවයේ අරුතක් නොමැතිව
ඔබ වෙතටයි මා එන්නේ
ජේසු අම්මේ කියා දෙන්න මට
කේසේද ඔබ වගේ වෙන්නේ

**සෙනුරි තරුෂිකා**
5 ශ්‍රේණිය
උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දහම් පාසල
මහියංගණය

## ගුරු මෑණියනි



ප්‍රර්ථනා මල් එකින් එක
ලොවට පුදන්නට
සඳක් සේ පායා
ලොවම එළිය කරන්නට
විල් තෙරක පිපී

කුසුමන් ලෙසින්
දසත සුවඳවත් කරන්නට
අවිදු අඳුර දුරලා
නැණ පහන් දල්වා
ජය මාවත කරා ළඟා වන්නට
නිබඳ අත් වැලයි නුඹ මට
දයාබර ගුරුමෑණියනි.

**ශාලනි හසන්නි හංසිකා**
09 ශ්‍රේණිය
ශු. පවුලේ දහම් පාසල - බිබිල

## මගේ සිත

සමිඳුනි මගේ සිත තුළ අහංකාරයක් නැත.
උදාර ලෙස මම ඇස් නොඑසවමි
වඩා උසස් දේ ගැනවත්
මාගේ තරම ඉක්මවා යන දේ ගැනවත්
මම කරදර නොවෙමි.
ඒ වෙනුවට මම, ළද දෙයින්
නිහතමානීව සතුටිව් සිටිමි.

**චානිකා ප්‍රියදර්ශනී**
10 ශ්‍රේණිය - ආරෝග්‍යමාතා දහම් පාසල
ඉලන්තිඅඩිය (තලවිල මීසම)



## මුහුදු වෙරළ

මුහුදේ රළ පයේ හැපෙනවා
හෝ හෝ ගාමින් සුළං හමනවා
ඉර බැස යන විට ආස හිතෙනවා
සුන්දර වෙරළක අසිරි මැවෙනවා

**ගීති නතාෂා දෙව්මිණී**
08 ශ්‍රේණිය
ශා. රීතා දහම් පාසල
කඩිගමුව - (මණ්ඩකොණ්ඩාන මීසම)



## මරි මව්නි

ජීවිතය ගලන ගඟකි විටෙක නිසසල
ගඟකි විටෙක රළු ලෙස ගලන
එම ජීවිතය නම් ගංගාවෙහි
දේව කැමැත්ත නම් දිය උල්පත
ගලා යන්නට සැලැස්වූ
දේව දියණිය ඔබයි මරි මවුනේ

ලෝ දනා පාපයෙන් ගලවන ලෙසට
ගැලවීම තම කුසයෙන් අප වෙත ලබාදුන
සියලු දුක් වේදනා අප වෙනුවෙන් දරාගෙන
යහපත් පරමාදර්ශයක් වූ සරණිය ඔබයි

**තාරුකා කාවින්දි**
11 ශ්‍රේණිය
ශු. ජපමාල මාතා දහම් පාසල
බණ්ඩිරිප්පුව



## පොළොන්නරුව දිසා ළමා රැළිය

"ළමා ඔබ දෙවිඳුන් අභියස උතුම් සම්පතකි" යන තේමාව යටතේ 2013 අනුරාධපුර පදවියේ පොළොන්නරුව දිසා ළමා රැළිය පසු ගියදා අලගොල්ලෑව සාන්ත අන්තෝනි දෙව්මැදුරු භූමියේදී අනුරාධපුර පදවි රදගුරු අති උතුම් නෝබට් අන්ද්‍රාදි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. පොළොන්නරු දිසානායක ගරු රංජිත්ද මෙල් පියතුමන්ගේ මග පෙන්වීම යටතේ ගරු පියතුමන්ලා පැවිදි සොයුරියන් හා දහම් ගුරුවරුන්ගේද සහයෝගයෙන් මෙම වැඩසටහන දියත් කෙරිණි.

**රෝෂිණී ලලන්ති**

## මොරටුව දිසාවේ ධර්මදූත ළමුන්ට තරග

මොරටු දිසා ධර්මදූත නර්ථන හා නාට්‍ය තරග පසුගියද කඩලාන ශු. අන්තෝනි දෙව්මැදුරු ශාලාවේදී 1-3, 4-6,7-9, ශ්‍රේණි වයස්කාණ්ඩ යටතේ පැවැත්වුණි. මෙම තරග පැවැත්වීමේ මූලික අරමුණ දරුවන්ගේ කුසලතා වර්ධනය කරමින් තරග වලින් ජය ගන්නා කණ්ඩායම් සම්බන්ධ කොට වර්ෂ අවසානයේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීමයි. මෙදින මොරටු දිසා නව ධර්මදූත අධ්‍යක්ෂ ගරු දිනේෂ් ප්‍රසාද් පියතුමාව දරුවන් හා සජීවික සජීවකාවෝ පිළිගත්හ.

**අසික ප්‍රියදර්ශන**

## කටුනේරිය මීසමේ සුදතුම් වරම් ලබන ළමුන්ට විශේෂිත වැඩසටහනක්..

සුදතුම් වරම් ලැබීමට සූදනම් වන කටුනේරිය මීසමේ ළමුන් සඳහා විශේෂිත දෙසුමක් 2013 ඔක්තෝබර් මස 12 වන දින දෙව්මැදුරු ශාලාවේදි පැවැත්වේ.

මීසම් සේවක ගරු සුනිල් විජේසිංහ පියතුමාගේ මගපෙන්වීම යටතේ මීසම් සහයක ගරු ඉමල්ක පීරිස් පියතුමන් විසින් දහම් පාසල් ආචාර්ය මඬුල්ලේ සහයෙන් මෙය සංවිධානය කරනු ලබයි. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක කුමර නයනජිත් මහතා විසිනි. "නූතන මාධ්‍ය භාවිතය හා තාරුණ්‍යය" යන මැයෙන් දෙසුම පැවැත්වේ.

## "දිව්‍ය සත්ප්‍රසාදිය ප්‍රාතිහාර්ය" ප්‍රදර්ශනයක්



පිටිපන මිසමේ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයට සමගාමීව මීගමුව පිටිපන සා. මරියා උත්සව ශාලාවේදී "සත්ප්‍රසාදීය ප්‍රාතිහාර්ය" පිළිබඳ වූ ප්‍රදර්ශනයක් පැවැත්වුනි. පිටිපන ශා. මරියා මහා විදුහලේ ගුරුවරුන් ළමුන් මෙම ප්‍රදර්ශනය නරඹන අයුරු **එම්.පී.එස්. ප්‍රනාන්දු**

## ලොවට සාමය පතා යැදුම් මෙහෙයක්



අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ ඉල්ලීම මත ලෝක සාමය වෙනුවෙන් යදින්නට වෙන් කළ දිනයක් විශේෂ යාච්ඤා මෙහෙයක් කෝට්ටපිටිය මීසම් සේවක ගරු ක්‍රිස්ටි පෙරේරා පියතුමන්ලේ මග පෙන්වීම යටතේ ධර්මදූත ළමෝ සංවිධානය කළහ. එදින විශේෂයෙන් ලෝක සාමය වෙනුවෙන් හා අප රටේ පවුල් වල සාමය හා ආදරය වර්ධනය කරන ලෙස දේවමාතාවන්ගේ මැදිහත් පිහිට අශිර්වාදය පතා යාච්ඤා කෙරිනි. **සුරේකා**

සුදතුම් වරම් ලැබීමට සූදනම් වන වෙන්නප්පුව මීසමේ යොවුන් දූ පුතුන් සඳහා විශේෂිත දෙසුමක් පසු ගියද වෙන්නපුව සකරියස් ශාලාවේදී පැවැත්වුණි. වෙන් නප්පුව මීසම් සේවක ගරු එරික් සී ප්‍රනාන්දු පියතුමාගේ මග පෙන්වීම යටතේ මීසම් සහයක ගරු සුජාන් නිශ්ශංක පියතුමන් විසින් මෙය සංවිධානය කරනු ලැබිනි. මෙය මෙහෙයවනු ලැබුවේ ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. "නූතන මාධ්‍ය භාවිතය හා තාරුණ්‍යය" යන මැයෙන් දෙසුම පැවැත්වුණි. මෙය සඳහා ළමෝ 150 පමණ සහභාගි වූහ.

**සේයා :- මයිකල් පෙරේරා සටහන :- ප්‍රියන්ත පීටර්ස්**



# ළමා කතා ලියූ ක්‍රිස්තියානි විශ්ව ලේඛකයෝ 04

## ''එකමත් එක කාලෙක''
## ළමා සුරංගනා කතා ලෝකෙට හඳුන්වා දුන් ක්‍රිස්තියානි ලේඛකයන් තිදෙනා


ඇන්ඩර්සන්


ග්‍රිම් සොහොයුරන් දෙදෙනා


විල්හෙල්ම්

මේ නිසා මේ කතා ලියා අවශ්‍ය කරුණු හා සාධක උපුටා ගෙන කතා ගැන ඔව්හු අමතක කළහ. මිතුරකු මේ කතා නො කියවන්නට මේවා සඳහටම අමතක වී යන්නට ඉඩ තිබුණි. හදිසියේ ම ගම්බද සිට නගරයට පැමිණි මිතුරකු දෙසොහොයුරන් බැහැ දැකීමටද පැමිණියේ ය. කාමරයේ මුල්ලක දමා තිබුනු අත් පිටපතක් නිකමට මෙන් ගත් ඔහු පිටුවක් දෙකක් කියවන්නට වී ය.

කතා රසයෙන් මත් වූ මෙය මුද්‍රණය කරන ලෙස ඔවුන්ට බල කළේ ය. දෙසොහොයුරෝ පොත ගැන එතරම් දෙයක් නොසිතූහ. මිතුරාගේ කරදරය නිසා පොත මුද්‍රණය කිරීමට එකඟ වූහ. පොත එතරම් නොවිකෙනෙනු ඇතැයි සිතූ ඔව්හු පොත සඳහා මුදලක් ද නොගත්හ. එහෙත් වූයේ අනෙකකි. ඒ පොත උනු කැවුම් මෙන් විකිණෙන්නට විය. කලකට පසු නැවතත් දෙසොහොයුරෝ තවත් කතා රැසක් එකතු කර තවත් පොත් දෙකක් මුද්‍රණය කළහ. අවසානයේදී කතා දහසකින් යුත් මේ පොත කතා දෙසිය දහසකින් සමන්විත විය. අද ''ග්‍රිම් සොහොයුරන්ගේ සුරංගනා කතා'' නමින් ප්‍රසිද්ධ ව ඇත්තේ මේ කතා සංග්‍රහය යි.

කතුවරුන් විසින් ම අලෙවි නොවන පොතක් ලෙස හඳුන්වනු ලැබු මේ පොතෙහි පිටපත් දහ කෝටියක් පමණ අද වන විට විකිණී ඇත. මෙය භාෂාවන් පනහකට පමණ පෙරලී ඇත. ජර්මනියෙන් ඇරඹුනු මේ සුරංගනා කතා අද ලොව ඕනෑ ම රටක කුඩා ළමුන්ගේ දිව'ග ඇත. හිමකුමාරි, සින්ඩරෙල්ලා, හැන්සල් සහ ග්‍රෙටල්, ටොම් තම්බ් අද ඒ ඒ රටවලම කතා මෙන් ළමුන් විසින් පිළිගෙන ඇත. ලෝකයේ නා නා රටවල නාට්‍ය , ගීත නාට්‍යවලට මේ කතා විෂය වී ඇත. දැන් මේ කතා පසුබිම් කර ගෙන චිත්‍රපට කීපයක් ද නිපද වී ඇත. ලඟ දී ලංකාවේ ද ''හිමකුමාරි'' කතාව ඇසුරෙන් තනනු ලැබූ ළමා චිත්‍රපටයක් පෙන්වනු ලැබීය. මෙතරම් ප්‍රසිද්ධියක් ලැබූ පොතකින් වුව ද එහි කතුවරුන්ට එතරම් යහපතක් සිදු නො විණ. ඔව්හු ප්‍රසිද්ධියට කැමති නො වූහ.

මුදල් අතින් ද ඔවුනට යහපතක් සිදු නොවිණ. පොත කොතරම් අලෙවි වුවත් ඔවුනට ලොකු මුදලක් නොලැබිණ. ඔවුන් මුදලක් බලාපොරොත්තු වූයේ ද නො වේ. විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසු ඔව්හු ශාස්ත්‍රයට ම දිවි කැප කළහ. විශේෂයෙන්ම ජේකබ් ජීවත් වූයේ ශාස්ත්‍රය සඳහාම විය. ඔහු ජර්මන් භාෂාවේ නිෂ්පත්තිය ගැන පර්යේෂණ පැවැත්විය. ව්‍යාකරණ ගැන පර්යේෂණ පැවැත්විය. අවසානයේදී භාෂාවක විකාශනය කිසියම් න්‍යායකට අනුව සිදු වන බවත් ඔහු සොයා ගත්තේය. තුලනාත්මක වාග් විද්‍යාවේ පියා ලෙස සළකනු ලබන්නේ ජේකබ් ග්‍රිම් ය. වාග් විද්‍යාව මූලික සිද්ධාන්තයක් වන ග්‍රිම්ගේ නීතිය සොයා ගනු ලැබුවේ ද ඔහු විසිනි.

විල්හෙල්ම් ඊට වඩා සැහැල්ලු දිවියකට කැමති වුවද ශාස්ත්‍රීය පර්යේෂණ අත් නොහළේ ය. විවාහ වූ පසුවද දෙසොහොයුරෝ ඉතා කිට්ටු වූහ. විල්හෙල්ම් ජේකබ්ට ද තම නිවසෙහි නවතින ලෙස ආරාධනා කළේය. විල්හෙල්ම්ට දරුවන් තිදෙනෙකු විය. දෙදෙනා මිය යන විට ද ජර්මන් භාෂාවේ ශබ්ද කෝෂයක් පිළියෙල කරමින් සිටියහ. එහෙත් ඔවුනට ශබ්දකෝෂය සම්පූර්ණ කිරීමට නොහැකි විය. ඔවුන් ඇරඹූ මේ ශබ්දකෝෂය 1960 කිහිප දෙනෙකුගේ ම සහායෙන් සම්පූර්ණ කරනු ලැබීය. මේ ශබ්දකෝෂය ඔවුන්ගේ ශාස්ත්‍රීය ඥානයට උපහාරයක් වුව ද ග්‍රිම් සොහොයුරන්ගේ රුව ලොව සෑම රටකම මිනිසුන්ගේ හදවතෙහි ඇඳී පවත්නේ ඔවුන් එකතු කළ සුරංගනා කතා නිසා මය.

ලක්ෂමන් වික්‍රමසිංහගේ
ලිපියකින් කරුණු උපුටා ගැණිනි.

**සංස්කාරක පියතුමන් විසිනි**

# රට රටවල කතෝලික ජ

| රට | කතෝලික පිරිස | මුළු ජනගහණය | ප්‍රතිශතය | රදගුරු පදවි | පදවි පූජක |
|---|---|---|---|---|---|
| හොන්ඩුරාස් | 5,790,000 | 7,288,000 | 79.45% | 8 | 203 |
| ඔස්ට්‍රියාව | 5,755,000 | 7,982,000 | 72.10% | 12 | 2,629 |
| වියට්නාමය | 5,658,000 | 82,312,000 | 6.87% | 25 | 2,194 |
| එල් සැල්වදෝරය | 5,436,000 | 7,144,000 | 76.09% | 9 | 469 |
| ඔස්ට්‍රේලියාව | 5,239,000 | 18,841,000 | 27.81% | 32 | 1,943 |
| පැරගුවේ | 5,239,000 | 5,722,000 | 91.56% | 15 | 333 |
| නිකරගුවා | 5,212,000 | 6,385,000 | 81.63% | 8 | 296 |
| නෙදර්ලන්තය | 5,042,000 | 16,117,000 | 31.28% | 8 | 1,387 |
| මහා බ්‍රිතාන්‍යය | 4,787,000 | 56,276,000 | 8.51% | 32 | 4,031 |
| යුක්රේනය | 4,766,000 | 64,915,000 | 7.34% | 19 | 2,348 |
| මැඩගස්කරය | 4,701,000 | 20,072,000 | 23.42% | 20 | 498 |
| බුරුන්ඩි | 4,567,000 | 6,999,000 | 65.25% | 7 | 340 |
| දකුණු කොරියාව | 4,377,000 | 49,409,000 | 8.86% | 18 | 2,672 |
| මොසැම්බික් | 4,314,000 | 19,318,000 | 22.33% | 12 | 186 |
| කැමරූන් | 4,287,000 | 17,109,000 | 25.06% | 23 | 902 |
| අයර්ලන්තය | 4,161,000 | 5,467,000 | 76.11% | 26 | 3,097 |
| රුවන්ඩා | 4,133,000 | 8,625,000 | 47.92% | 9 | 413 |
| සුඩානය | 4,019,000 | 44,028,000 | 9.13% | 9 | 269 |
| ස්ලොවේකියාව | 3,942,000 | 5,395,000 | 73.07% | 9 | 2,037 |
| ක්‍රොයේෂියාව | 3,867,000 | 5,259,000 | 73.53% | 15 | 1,496 |
| කොස්ටාරිකාව | 3,763,000 | 4,513,000 | 83.38% | 8 | 549 |
| චෙක් ජනරජය | 3,519,000 | 10,284,000 | 34.22% | 9 | 1,376 |
| සැම්බියාව | 3,425,000 | 12,138,000 | 28.22% | 10 | 283 |
| මලාවි | 3,281,000 | 15,081,000 | 21.76% | 7 | 281 |
| ස්විට්සර්ලන්තය | 3,186,000 | 6,914,000 | 46.08% | 8 | 1,775 |
| දකුණු අප්‍රිකාව | 3,101,000 | 48,770,000 | 6.36% | 27 | 453 |
| චීනය | 2,964,000 | 397,673,000 | 0.75% | 117 | 2,270 |
| අයිවරි කෝස්ට් | 2,841,000 | 18,805,000 | 15.11% | 14 | 652 |
| පුවර්තෝරිකෝ | 2,799,000 | 3,823,000 | 73.21% | 5 | 369 |
| ලිතුවේනියාව | 2,766,000 | 3,457,000 | 80.01% | 8 | 681 |
| ඝානාව | 2,675,000 | 21,520,000 | 12.43% | 18 | 876 |
| උරුගුවේ | 2,315,000 | 3,176,000 | 72.89% | 10 | 203 |
| ඇන්ටිල්ස් (කැරබියන් දූපත්) | 2,233,000 | 8,241,000 | 27.10% | 21 | 287 |
| කොංගෝව | 2,077,000 | 4,114,000 | 50.49% | 7 | 176 |
| ලෙබනනය | 1,883,000 | 4,822,000 | 39,05% | 23 | 1,001 |

# නගහණය

කිතුනු උරුමය

ශිරාන් මෛත්‍රි විසිනි

| නිකායික පූජක | මුළු පූජකවරු | ස්ථිර තේවාචාරීන් | පැවිදි (පිරිමි) | පැවිදි (කාන්තා) | මිසම් |
|---|---|---|---|---|---|
| 214 | 417 | 1 | 243 | 779 | 182 |
| 1,731 | 4,360 | 425 | 2,374 | 5,220 | 3,058 |
| 474 | 2,668 | 11 | 2,793 | 11,443 | 2,228 |
| 238 | 707 | 4 | 344 | 1,491 | 418 |
| 1,172 | 3,115 | 53 | 2,138 | 6,876 | 1,378 |
| 766 | 1,099 | 112 | 1,011 | 2,127 | 374 |
| 123 | 419 | 27 | 219 | 1,028 | 252 |
| 2,031 | 3,418 | 310 | 3,383 | 9,128 | 1,520 |
| 1,622 | 5,653 | 612 | 2,177 | 7,109 | 3,099 |
| 411 | 2,770 | 11 | 665 | 1,095 | 4,026 |
| 645 | 1,143 | - | 1,494 | 3,930 | 314 |
| 95 | 435 | - | 302 | 1,093 | 132 |
| 539 | 3,211 | - | 1,472 | 8,397 | 1,366 |
| 312 | 498 | 1 | 536 | 979 | 280 |
| 504 | 1,406 | 16 | 1,019 | 1,958 | 740 |
| 1,593 | 4,690 | 1 | 2,460 | 8,088 | 1,312 |
| 124 | 537 | - | 331 | 1,390 | 138 |
| 95 | 364 | 4 | 167 | 343 | 195 |
| 591 | 2,628 | 20 | 996 | 3,018 | 1,507 |
| 833 | 2,329 | 1 | 1,018 | 3,288 | 1,603 |
| 212 | 761 | 3 | 327 | 948 | 307 |
| 620 | 1,996 | 152 | 798 | 1,935 | 3,139 |
| 354 | 637 | 1 | 596 | 1,596 | 265 |
| 127 | 408 | - | 265 | 963 | 147 |
| 1,225 | 3,000 | 157 | 1,606 | 5,679 | 1,662 |
| 645 | 1,098 | 213 | 1,132 | 2,577 | 736 |
| 2,289 | 4,559 | 6 | 1,933 | 6,079 | 2,335 |
| 237 | 889 | 6 | 533 | 831 | 287 |
| 365 | 734 | 418 | 469 | 1,158 | 327 |
| 98 | 779 | 4 | 145 | 773 | 677 |
| 193 | 1,069 | 1 | 476 | 794 | 366 |
| 256 | 459 | 76 | 382 | 1,089 | 226 |
| 337 | 624 | 81 | 518 | 1,055 | 465 |
| 62 | 238 | 1 | 152 | 232 | 158 |
| 602 | 1,603 | 4 | 1,030 | 2,728 | 1,253 |

ඉදිරියට .......



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 111

## "It's high time" / "It's about time"

බලන්න මෙහිදීත් ක්‍රියා පදයට යෙදෙන්නෙ අතීත ස්වරූපයයි. **Went, Stopped, Punished** යනාදි වශයෙන්.

ඒ වගේම අපිට ඒ අදහසම ප්‍රකාශ කරන තවත් විදියක් තියෙනවා. ඒ තමයි

**"It's high time"** කියන යෙදුම.

It's **hight time** he **came.**

(ඉට්ස් හයි ටයිම් හී කේම්)

ඔහු ආවා නං හොඳයි. (එන්න කාලෙ හොඳයි)

මෙහිදීත් අපි යොදන්නෙ came වගේ අතීත පදයක්. ඒත් ඒක අතීත සිදුවීමක් ගැන නෙමේ මෙහිදී ප්‍රකාශ කරන්නෙ. වර්තමාන සිදුවීමක්.

It's **high time** the Emard **returned** the books to the library.

(ඉට්ස් හයි ටයිම් දැට් එමාර්ඩ් රිටර්න්ඩ් ද බුක්ස් ටු ද ලයිබ්‍රරි)

ඉමාඩ් පොත් ටික පුස්තකාලෙට බාර දෙන්න දැන් කාලෙ හරි.

It's **high time** you **stopped** your stupid habits. You are an adult now.

(ඉට්ස් හයි ටයිම් යූ ස්ටොප්ඩ් යුවර් ස්ටුපිඩ් හැබිට්ස්. යු ආ(ර්) ඇන් එඩල්ට් නව්)

ඔබේ ඔය මෝඩ පුරුදු නතර කළා නම් හොඳයි. ඔබ දැන් වැඩිහිටි කෙනෙක්.

It's **high time** that we **warned** him.

(ඉට්ස් හයි ටයිම් දැට් වී වෝන්ඩ් හිම්)

ඔහුට අවවාද කිරීමට දැන් හොඳම කාලය. මෙච්චර කල් ඉවසුව. දැං ඉතිං අවවාද කරන්න ඕනම කරනව කියන අදහස කියැවෙනවා.

බලන්න නැවත මතක් කර ගනිමු.

"දැන් ඉතිං යමක් කළා නං හොඳයි" කියන අදහස කීමට අපි ක්‍රමකීපයක්ම යොදාගන්නවා.

අපි දැන් දවල් කෑම ගනිමු. දැන් තමයි හොඳම වෙලාව කෑව නං හොඳයි කියන අදහස අපි ඉගෙනගත්තු හැමවිදිහටම භාවිතා වන හැටි නැවත සලකා බලමු.

මේ වැකිවල සුළු සුළු වෙනස්කම් තිබුණත් සමස්ථයක් වශයෙන් පිළිබිඹු වන්නේ එක අදහස.

1. We'd better eat lunch now (have lunch කියන්නත් පුළුවන්)
2. It's time for us to eat lunch.
3. It's time we ate lunch.
4. It's about time we ate lunch.
5. It's high time we ate lunch.

අපි පොඩි අභ්‍යාසයක් මගින් අපේ දැනුම තහවුරු කරගනිමු.

### අභ්‍යාසය

පහත සඳහන් වැකිවල හිස්තැන් පුරවන්න. (වචන එකක්, දෙකක් හෝ ඊට වැඩි ගණනක් යෙදිය හැකියි.

1. මට මුදල් ටිකක් අවශ්‍යයි. බැංකුවට ගියොත් හොඳයි.
   I need some money. I'd better ......... to the bank.

2. සුනිමල් ඔබෙන් දුරකථන ඇමතුමක් එනතුරු බලා සිටී. එයාට අමතන්න.
   (ගන්න ඕන නේද? ගත්තනං හොඳයි නේද? යන අදහස)
   Sunimal is waiting for your call. You ....... better call him.

3. මම ජනේල අරින්නද? එපා. ඒක වහල තියෙද්දෙන්.
   Shall I open the window? No, you ...... leave it open.

4. කෝච්චිය තියෙන්නෙ එකට. ඔබ දැන් ගියා නං හොඳයි.
   The train is at one 'O' Clock. You ....... better ..... now.

5. රජය මේ ප්‍රශ්නය ගැන යමක් කලා නං හොඳයි.
   (කරන්න සුදුසු වෙලාව ඇවිත්)
   It's time the government ..... something about the problem.

6. මම හිතන්නෙ ඔබ දැන් රියදුරු බලපතක් ගන්න නං දැන් කාලෙ හොඳයි.
   I think it's about time you ...... (get) the driving licence.

7. දැන් ඉතිං බඳින්න කාලෙ හරි කියල ඔබට හිතෙන් නැද්ද?
   Don't you think it's about time you ..... (get) married?






රාජකදළුව මීසම් සේවක ගරු චමින්ද ප්‍රසාද් පියතුමාගේ ආරාධනාවෙන් කටුනේරිය මීසම් සහයක ගරු ඉමල්ක පීරිස් පියතුමන් විසින් රාජකදළුව මීසමට අයත් දේවස්ථාන 7ක ළමෝ අසූ දෙනෙකුහට රාජකදළු ශු. පවුලේ දේවස්ථානයේදී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දනය  කළහ. රාජකදළුව මීසම් සහයක ගරු රනිල් සඳරුවන් පියතුමා ගරු ඇනී මේරී පැවිදි සොහොයුරිය සමග  දහම් ගුරු වරුන්ගේ සහයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරිනි. දිව බොදුන් ලැබූ ළමුන් ගරු පියතුමන්ලා පැවිදි සොහොයුරිය සමග සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **ක්‍රිස්ටෝෆර් ජාන්ස**

---



නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේව මාතා සිද්ධස්ථානයේ ළමෝ 76 දෙනකු පසුගියදා හලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය ලබා ගත්හ.

සිද්ධස්ථාන පාලක ගරු උපාලි චර්චිල් පියතුමන්ගේ මග පෙන්වීමෙන් සහයක ගරු නිමන්ත ප්‍රගිත් පියතුමන් හා ගරු පැවිදි සොයුරියන්ගේ දහම් ගුරුමඩුල්ලේ සහයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරිනි. සුදතුම් වරම් ලැබූ ළමුන් රදගුරු හිමිපාණන්, ගරු පියතුමන්ලා , පැවිදි සොයුරියන් හා දහම් ගුරුවරියන් සමඟ සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. **ශ්‍රියාංගණී පිලිෂියා.**

---






කඳවල වික්ෂෝප දේව මාතා දෙව් මැදුරට අයත් දහම් පාසල් ශිෂ්‍ය නායක නායිකාවන් පසුගියදා දිව්රුම් දුන්හ.

මීසම් සේවක ගරු සරත් තිරිමාන්න පියතුමා ගරු පැවිදි සොයුරියන් දහම් ගුරු මඩුල්ල හා දූ දරුවන් මෙසේ ළමා ප්‍රදීප කැමරාවට මුහුණ දුන්හ.

**සිසිල් ඩැනීසියස්**



පමුණුගම මහ විදුහලට අනුබද්ධිත බෝපිටිය ප්‍රථමික අංශයේ නිල ලාංඡන පැළඳවීම විදුහල්පති අනුර ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. ශිෂ්‍ය නායක නායිකාවන් නියෝජ්‍ය විදුහල්පති කාන්ති රුද්‍රිගු හා අංශභාර සීතා ප්‍රනාන්දු පුල්ලේ ගුරු මහත්මීන් සමග මෙසේ සේයාරුවට මුහුණ දුන්හ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**

## පුංචි අපේ චිත්‍ර පිටුව



**ශු. අන්තෝනි මුනිතුමා**

**නිරුක්ෂි ශේෂානි**

09 ශ්‍රේණිය

නිමල මරියා බාලිකා මහ විදුහල

තුඩැල්ල

**අපගේ ගැළවුම්කරුවාණෝ**

**රවිඳු හේෂාන් චතුරංග**

09 ශ්‍රේණිය

ශු. මිකායෙල් දහම් පාසල - කළුතර , නාගොඩ





**මරිය තුමිය**

**කාවින්දි පෙරේරා**

06 ශ්‍රේණිය

සාන්ත ජෝසප් දහම් පාසල

කෙරවලපිටිය



**සතුන්ට කරුණාව දක්වමු**

**මිහිනි ධර්මසේන**

01 ශ්‍රේණිය

සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය

කොළඹ 07

**සහෝදර ප්‍රේමය**

**ෂෙනෝලි වර්ෂා ප්‍රනාන්දු**

07 ශ්‍රේණිය - සාන්ත ජූඩ් විදුහල - කුරණ





**මාල ගිරවෙක්**

**ට්‍රෙවෝන් ශෙනන් රිංස්ලි**

06 ශ්‍රේණිය

ශු. පාවුළු දේවස්ථානය

නෙළුම්පිටිය (දළුපත මීසම)

# ශා. වින්සන්ති ද පාවුලා මුනිතුමා




ශාන්ත වින්සන්ති ද පාවුලා මුනිතුමා උපත ලැබුවේ 1581 ගැස්කනි නම් කුඩා ග්‍රාමයේදීය. මොහු සාමාන්‍ය ගොවි පවුලක සිවුවන දරුවා විය. කුඩා කල සිටම පියාගේ ගොවිපලේ හා සතුන් බලා ගැනීමට උදව් කරමින් යහපත් එඬේරකුගේ ලක්ෂණ පෙන්නුම් කළේය. එලෙසින්ම තම ජීවිතය යාච්ඤාව හා භාවනාව කර ගැනීමට ඔහුට හැකි විය. අධ්‍යාපනය පිළිබඳ මහත් උනන්දුවක් දැක් වූඔහුට තම මව්පියන්ගේ දිළිඳු ආර්ථිකය ඊට බාධාවක් විය.



එකල එම ප්‍රදේශයේ නගරාධිපති සහ දෙව් මැදුරේ ගරු පියතුමා මොහුගේ දිළිඳුකම සලකා බලා ඔහුගේ පාසල් අධ්‍යාපනය සඳහා උදව් විය. තම අධ්‍යාත්මික අධ්‍යාපනය උසස් ලෙස නිමා කරමින් 20 වැනි වියට පත් වීමට ප්‍රථමයෙන් 1600 වසරේදී පූජක වරම් ලැබීය. එහෙත් 1605 දී තුර්කි කොල්ලකරුවන්ගේ ග්‍රහනයට හසු වූ මෙතුමා වසර 2 ක් පමණ කාලයක් ටියුනිස් නුවර වහල් ජීවිතයට හිමිකම් ලැබීය. ඉන් නිදහස් වී ආ පසු තම අපෝස්තලික කාර්යයේ නියැලෙමින් සුවහසක් ජනතාවගේ සිත්සතන් පහන් කරමින් සිටි මොහොතේ හතර වෙනි හෙන්රි රජුගේ ඝාතනය නිසා ඇති වූ නොසන්සුන්තාවය මත 1610 මෙතුමාට මෙම ප්‍රදේශය අත්හැර යාමට සිදු විය. මෙතුමා ''ස්වර්ග යේ ආරක්ෂිතයා'' යන විරුදාවලියෙන් ජනයා අතර ප්‍රචලිත විය.

මෙතුමාගේ මුළු ජීවිතයම දිළිඳුන් වෙනුවෙන් කැප කළේය. ඉන්පසු ක්ලිච් ප්‍රදේශයේ මීසමේ පාලන කටයුතු බාර ගන්නා අතරම එකල පැවති සිර කඳවුරේ භා-ණ්ඩාගාරික ධූරය ලැබීය. එලෙසම මෙතුමා දුප්පතුන්ගේ දාසයා යන නාමයෙන් ද පිදුම් ලැබීය. මේ අතර දයාවේ සොහොයුරියන්ගේ නිකායද ප්‍රංශයේදී ආරම්භ කළේය. අනාථ නිවාසවල වෙසෙන දරුවන් හා යුද්ධයෙන් අතරමං වූ දරුවන් වෙත සහන සැලසීම සඳහා අනාථ නිවාස ඇති කිරීමට මෙතුමා සහය වී ඇත. ජීවිතයේ යථාර්ථය තුළ දයාවේ හස්තය රෝපණය කළ මෙතුමා යාච්ඤාවට හා පොදු ක්‍රියාවලියට තම කාලය වෙන් කර ගනිමින් ඉදිරියටම ගමන් කළේය. අද සමාජයට හා විශේෂයෙන් පැවිදි පූජකයන්ට මෙතුමා හොඳ ආදර්ශයක් වනු ඇත. මෙසේ වසර 79 ක් කිතුනු සභාව ආලෝකමත් කරමින් 1660 දී මෙතුමා ස්වර්ගස්ථ විය. ලියෝ නමැති ශුද්ධෝත්තම පියතුමා 1737 ජුනි 16 වන දින වින්සන්ති ද පාවුලා යන මෙතුමා ශුද්ධවරයට ඔස-වමින් දයා සේවාවේ සාන්තුවරයා යන නාමය ප්‍රදනය කරන ලදී.

**ඇන් දිල්හානි**
08 ශ්‍රේණිය
ශා. වි.පාවුලා ළමා කොන්ෆරසය
ශා. ඇග්නස් දෙව්මැදුර - පන්නල

# දංකොටුව බාලිකාවෙන් දුර පැනීමේ ශූරියක්



ශ්‍රීමත් ජෝන් ටාබට් කනිෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලිය 44 වන වරටත් පසුගියදා හෝමාගම දියගල මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ දී පැවැත්විණ.

එහිදී වයස අවුරුදු 15 න් පහල දුර පැනීමේ තරගයෙන් ප්‍රථම ස්ථානයත් එම ක්‍රීඩා උළෙලේ දුර පැනීමේ ඉසව්වේ දක්ෂතම ක්‍රීඩිකාව ලෙසත් තිළිණ දිනන්නට දංකොටුව බාලිකා මහ විදුහලේ ප්‍රමෝදිනි නුවන්ජනා මධුවන්ති ශිෂ්‍යාව සමත්විය. ප්‍රමෝදිනි නුවන්ජලා හට ළමා ප්‍රදීපය ශුභ පැතුම්. **(ඇන්ටන් ජේරාඩ් ප්‍රනාන්දු)**

## තලවිල ළමා ප්‍රදීපය ජනප්‍රියයි !

**පළමු වතාවට ළමා ප්‍රදීපය 100 ක් අලෙවි කෙරේ.**

**තලවිල සා. ආනා ජාතික සිද්ධස්ථානයේ මේ වන විට ළමා ප්‍රදීපය අලෙවිය පුවත් පත් 100 දක්වා වැඩි වී ඇත. පුවත් පත් 10 කින් මෙය ආරම්භ කෙරිනි. තලවිල සිද්ධස්ථාන පාලක ගරු නිහාල් පයස් පියතුමන්ගේ මග පෙන්වීම යටතේ සහයක ගරු දිලංක නිර්මාන් පියතුමන්ගේ මහත් උනන්දුව හා කැපවීම මත ළමුන් අතර අළුත් වූ ළමා ප්‍රදීපය පුවත් පත ජනප්‍රිය වීමට හේතු වී ඇත. කුමර නයනජිත්**

# නත්තල් වාර්ෂිකයන් සඳහා ළමා නිර්මාණ කරුවන්ට ඇරියුම්

## සාම මිහිර

නොමිලේ බෙදාහරින ''සාම මිහිර'' ජාතික නත්තල් කලාපයේ 55 වන නත්තල් වාර්ෂිකය සඳහා කාලීන තේමා වලින් සැකසුන ලිපි, කෙටි කථා, කාව්‍ය නිර්මාණ ඔක්තෝබර් මස 30 වන දිනට පෙර සංස්කාරක, සාම මිහිර ජාතික නත්තල් කලාපය, අංක 822/1 , ධර්මපාල මාවත, තේවත්ත, රාගම ලිපිනයට යොමු කරන්න. **ජයන්ත ශ්‍රී පද්මකුමාර**

## උපත

නොමිලේ බෙදාහරින ''උපත'' නත්තල් කලාපය සඳහා ළමා නිර්මාණ භාර ගැනේ. නත්තල හා බැඳුණු ළමා ඔබගේ නිර්මාණ සංස්කාරක ''උපත'' ප්‍රියන්ත, නිමල මරිය මාවත, වෙන්නප්පුව යන ලිපිනයට ඔක්තෝබර් 30 දිනට පෙර යොමු කරන්න.

ඔබගේ නිර්මාණය යොමු කරන විටදී ඔබේ නම, ශ්‍රේණිය, පාසල හෝ දහම් පාසලේ නම, ඔබගේ ලිපිනය, දුරකථන අංකය සඳහන් කර එවන්න. **ප්‍රියන්ත පීටර්ස්**

**ප්‍රහේළිකා අංක 40 පිළිතුරු සහ ප්‍රහේළිකා අංක 41 ලබන සතියේ**

## අපේ ළමා පොළ



කටාන ශු. පවුලේ පෙර පාසලේ සිඟිති ළමා පොළ පසුගියදා පැවැත්වුනි. දරුවන්ගේ ආකල්ප, කුසලතා හා පෞරුෂ වර්ධනය කිරීම මෙය පැවැත්වීමේ අරමුණ විය. මෙහි අවස්ථාවක් සේයා රුවෙහි දැක්වේ.

**සිසිල් ඩැනීසියස්**



## ළමා ලේඛක වැඩමුළු

### කොළඹ පදවිය

බෝපිටිය ලොයෙලා විදුහලේ මාධ්‍ය ඒකකයෙ සාමාජිකයින්ගේ ලේඛන කුසලතා එළිදැක්වීමේ අරමුණින් ලේඛක වැඩමුළුවක් 2013 ඔක්තෝබර් 10 වන බ්‍රහස්පතින්දා විදුහලේදී පැවැත්වේ.

විදුහල්පති ගරු තිලකසිරි ප්‍රනාන්දු (පැ.තු.නි.) පියතුමාගේ අනුශාසකත්වයෙන් විදුහල් මාධ්‍ය ඒකකය මගින් මෙය සංවිධානය කරනු ලබයි. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය.

සුරංගි රත්නායක (ආචාර් මඩුල්ල) ලොයෙලා විදුහල - බෝපිටිය



බටගම මීසමට අයත් බංඩිගොඩ නිර්මල හෘදයේ දේවමාතාවන්ගේ දෙව්මැඳුරට අයත් තරුණ සමිතිය මගින් දහම් පාසලේ ළමුන් සඳහා විශේෂිත දෙසුමක් සංවිධානය කළහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. "යහපත් කිතුනු දරුවන් වෙමු අපි" තේමාව යටතේ දෙසුම පැවැත්වූ අතර 6 ශ්‍රේණියේ සිට ඉහළ ළමෝ මීට සහභාගි වූහ. මෙයට ගීත භාවනාවක්ද ඇතුළත් විය. බටගම මීසම් සේවක ගරු නිශාන් විලත්ගමුව පියතුමන්ගේ අනුශාසකත්වයෙන් මීසම් සහයක ගරු ජූඩ් ක්‍රිස්මන් පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ දහම් ගුරුවරුන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරිණි. මීසම් සහයක පියතුමා, දේශක මහතා, දහම් පාසල් විදුහල්පති, තරුණ සමිතියේ පිරිස සමග මෙදින සහභාගි වූ ළමුන් සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු. **(අශේන් එස්. සේනාරත්න)**


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
මෝසෙස් 19
චිත්‍ර කතා රචනය ආනන්ද කල්දේරා
දෙබස් හා චිත්‍ර ඇස්. ඒ. පී. සපුආරච්චි
ඊශ්‍රායෙල් ජාතිකයන් දෙදෙනා කලහ කරමින් සිටිනු දුටු මෝසෙස්..
ඒයි නවත්තපල්ලා ඕක.. මේ නුඹෙලා ජාතියේ මිනිහෙක් නේද.. ඇයි.. මේ මිනිහට ගහන්නේ.. .. ..
ඇයි නුඹ කවුද මට උපදෙස් දෙන්න මම දැක්කා නුඹ අර ඊජිප්තු සෙබලාව මරා දානව.. දැන් නුඹ හදන්නේ ඒ.. වගේ මාවත් මරා දාන්නද..?
ආහ්.. මොනවා....?
මොනවා.. මෝසෙස් ඊජිප්තු සෙබලෙක්ව මැරුවා..
අහ්: මම දැන් මොකද කරන්නේ..
මහ විනාශයක් මම ඊජිප්තු සෙබලාව මරා දානව බොහු දැකලා.. මම හිතුවේ නෑ මෙතරම් ඉක්මනට මෙහෙම වෙයි කියලා.. මොවුන් මා කළ දේ දන්නවානම් ඒක මහා භයානක තත්වයක්. අද හෙටම මේක පාරාවෝගෙ කණටත් යයි...
රජතුමනි.. මෝසෙස් වැඩ බිමේදී.... ඊජිප්තු සෙබලෙක්ව මරා දාලා කියලා.. ආරංචියි.. සොයා බලනවිට ඔහුව මරා වැලි.යට සඟවා තිබුණා.....
මොනවා.. මහ ඊජිප්තු සෙබලෙක් ව මැරුවා.. ඔහු හෙබෙව් කොල්ලෙක්..? එසේනම් ඔහුව වහා සොයාගෙන විත් .. මරා දමනු.!
නමුත් එම අවස්ථාවේ.. මෝසෙස් ඊජිප්තුවෙන් ඈත.. මිදියන් දේශයට පලායමින් සිටියා....
..පාරාවෝගෙ... සෙබලු මාව හැම තැනම හොයනවා ...ඇති...

## බැති සිතින් දරුවන් පිරිවරා යන

# මාරවිල කුරුස පල්ලිය



මාරවිල කුරුස පල්ලිය.....
බැති සිතින් යැදුම සඳහා යා හැකි
තවත් වන්දනීය සිද්ධස්ථානයකි....

දෙමව්පියන් බොහෝ දෙනෙක් තම
සිඟිති දූ දරුවන්ද සමඟ නිතර
යැදුම හා බාරහාර සඳහා යන
එන මෙම අපූරු දෙව් මැදුර
දරුවන්ගේ විශ්වාසය
වර්ධනය කිරීමට සමත්
තවත් අපූරු පුදබිමකි....

මාරවිල කුරුස පල්ලිය අසල
මුහුදු වෙරළේ
අළුතින් ඉදි කළ
වේලන්කන්නි මාතා
ප්‍රතිමාව හා මණ්ඩපය

Photos By: Thilina Alahakoon











